පල්ලේපොල ප්‍රාදේශීය සභාව
මාතලේ දිස්ත්‍රික්කය

-----------------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 30 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට පල්ලේපොල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
--------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) බැකෝ යන්ත්‍රය අළුත්වැඩියා කිරීම වෙනුවෙන් අදාළ පෞද්ගලික ආයතනය වෙත ගෙවිය යුතු රු.406,739 ක මුදල අයකර ගතයුතු පාර්ශ්වය හඳුනාගෙන ගිණුම්ගතකර නොතිබුණි.

(ආ) ආදායම් විෂයයන් 3 ක ආදායම රු.3,387,151 ක් අඩුවෙන් දැක්වුණි.

(ඇ) වැටුප් ප්‍රතිපූර්ණය රු.2,419,225 ක් වැඩියෙන් දැක්වුණි.

(ඈ) ස්ථාවර වත්කම් ලේඛනයේ දක්වා තිබූ සභාවට අයත්, ඉඩම් අයිතම 10 කට අදාල අක්කර 13.5, රූඩ් 5 පර්චස් 61ක බිම් ප්‍රමාණයක වටිනාකම තක්සේරුකර ගිණුම්ගතකර නොතිබුණු අතර, භෞතික පැවැත්මක් නොතිබූ ගොඩනැගිලි 2ක එකතු වටිනාකම රු.144,844 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) එකතුව රු.5,002,061 ක් වූ ගොඩනැගිලි 03 ක ශේෂය අඩුවෙන් දැක්වුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයට අදාළ ප්‍රාග්ධන වැය රු.15,890,029 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.15,027,153ක් ලෙස දැක්වීමෙන් රු.862,876 කින් ප්‍රාග්ධන වැය අඩුවෙන් දැක්වුණි.

(උ) ඉදිකිරීම් අවසන්කර නොතිබූ ගොඩනැගිලි 2 ක් වෙනුවෙන් ලැබියයුතු හා ගෙවියුයතු රු.193,625 ක් වැඩියෙන් දැක්වුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්
---------------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන විවිධ ණයගිම් ශේෂය සහ උප ලේඛනයේ දැක්වෙන ශේෂය අතර රු.111,723 වෙනසක් පැවතුණි.

1.3.3 ලැබිය යුතු ගිණුම්

--------------------

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 8 ක එකතුව රු.18,739,452 ක් වූ අතර, වර්ෂ 3කට වැඩි කාලයක් ඉක්මවූ එකතුව රු.2,482,878ක් වූ ශේෂ ඊට ඇතුළත්වී තිබුණි.

1.3.4 ගෙවිය යුතු ගිණුම්

---------------------

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 10ක එකතුව රු.16,370,815ක්වූ අතර, වර්ෂ 3කට වැඩි කාලයක් ඉක්මවූ එකතුව රු.2,386,628ක්වූ ශේෂ ඊට ඇතුළත්වී තිබුණි.

1.3.5 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම.

---------------------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.81,872,736 ක්වූ ගිණුම් විෂයයන් 4කට අදාල ශේෂ සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.6 නීති,රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

---------------------------------------------------

නීති,රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 7 වන වගන්තිය | 2015 හා 2016 වර්ෂ තුළ රැස්කළ රු.56,605ක මුද්දර ගාස්තු පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි. |
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 218 රීතිය | 1987 න් පසු ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (ඇ) චක්‍රලේඛ හා වෙනත් | |
| (i) 2015 මාර්තු 10 දිනැති අංක 03/2014 (i) දරන භාණ්ඩාගාර ලේකම්ගේ චක්‍රලේඛයේ (ii) කාණ්ඩ අංක vi සහ මධ්‍යම පළාත් පළාත් පාලන කොමසාරිස්ගේ අංක 3/2/1/23 හා 2015 අගෝස්තු 26 දිනැති ලිපිය. | අනුමත රු.2,000 ක මුදල ඉක්මවා වියදම් දරා ඇති දුරකථන බිල්පත් ඉදිරිපත් කිරීමෙන් පසු රු.4,000 දක්වා බිල්පත් ප්‍රතිපූර්ණය කළයුතු වුවද, බිල්පත් ඉදිරිපත් කර නොතිබියදී, 2016 මාර්තු සිට දෙසැම්බර් දක්වා රු.4,000 ක දීමනාවක් සභා ලේකම්ගේ වැටුපට එකතුකර ගෙවීම්කර තිබීම හේතුවෙන් 2016 වර්ෂය තුලදී රු.20,000 ක මුදලක් උපදෙස්වලට පටහැනිව වැඩිපුර ගෙවීම්කර තිබුණි. |
| (ii) 1988 මැයි 17 දිනැති අංක 1988/22 දරන පළාත් පාලන දෙපාර්තමේන්තු චක්‍රලේඛය | නැවත තක්සේරුවක් සිදු නොකර 2005 වර්ෂයේ තක්සේරුව පදනම් කරගෙන සමාලෝචිත වර්ෂයට වරිපනම් බදු බිල්කර තිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 7,247,516 ක්වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,629,934 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.617,582ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රතිඵලයේ රු.617,582 ක වර්ධනයට ආදායම් විෂයයන් 3ක රු. 4,880,566ක ආදායම වැඩිවීම විශේෂයෙන් බලපා තිබුණි.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) 2010 වර්ෂයේ කොටස් කර විකුණන ලද ඉඩමකින් ලැබියයුතු විකුණුම් මත බදු රු.38,625ක් අයකර ගෙන නොතිබුණි.

(ආ) හිඟ සතිපොල කුලී වෙනුවෙන් අයවියයුතු දඩ ගාස්තුව රු.18,800 ක් හා හිඟ කඩකුලී රු.21,600 ක් අයකර ගෙන නොතිබුණි.

2.3.2 වරිපනම්

හිඟ හිටි වරිපනම් බදු ශේෂය රු.130,681 ක් වූ අතර, එම ශේෂය තුළ වසර 3කට වැඩි කාලයක් ඉක්මවූ රු.26,799 ක ශේෂ ඇතුළත් වී තිබුණි.

2.3.3 අක්කර බදු

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට හිඟ අක්කර බදු ශේෂය රු.34,542 ක් විය.

2.3.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වශයෙන් රු.939,195ක් හා මුද්දර ගාස්තු වශයෙන් රු.6,080,769 ක් අයවිය යුතුව තිබුණු අතර වසර 3කට වැඩි කාලයක් ඉක්මවූ මුද්දර ගාස්තු රු.825,857 ක් හා උසාවි දඩ රු.22,501 ක් පැවතුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවට එරෙහිව පවරා තිබූ නඩුවකට 2016 අප්‍රේල් 29 දිනැතිව ලබාදී තිබූ තීන්දුව අනුව සභාව වැයකර තිබූ නීතිඥ ගාස්තුව වූ රු.241,770 ක් පැමිණිලි පාර්ශ්වයෙන් අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ආ) 2014/2015 වර්ෂවල සභාවට ලබාදී තිබූ LL – 7660 කෘෂ කැබ් රථය හා PF-7357 දරන කැබ්රථය සභාව වෙත පවරා ගෙන නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ දෙක තුළ අනුමතකර තිබූ ගොඩනැඟිලි සැලසුම් 137 කින් 12 ක් සඳහා පමණක් 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 21 වගන්තිය ප්‍රකාරව අනුකූලතා සහතික නිකුත්කර තිබුණි.

(ඈ) 1987 අංක 17 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (1) උප වගන්තිය පරිදි සභා බල ප්‍රදේශයේ මාර්ග සම්බන්ධව 2015 සැප්තැම්බර් 18 දින ගැසට් පත්‍රයේ පලකර ඇතත්, 24 (3) වගන්තිය යටතේ නිසි කාලය තුළදී නැවත ගැසට් නොවීම නිසා සභාවේ මාර්ග සම්බන්ධව පනතේ විධිවිධාන ඉටුකිරීමට අපොහොසත්වී තිබූ අතර, මාර්ග ලේඛනයක්ද නඩත්තු කර නොතිබුණි.

(ඉ) සභාවේ කාර්ය මණ්ඩලය තුළ තනතුරු 4ක පුරප්පාඩු 11ක් හා තනතුරු 5ක අතිරික්තතා 7 ක් විය.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා
------------------------------

ගොඩනැඟිලි පහසුකම් සපයා ගැනීමකින් තොරව 2014 වර්ෂයේ රු.1,249,840ක් වැයකර තොරතුරු මධ්‍යස්ථානයක් පිහිටුවීමට පරිගණක යන්ත්‍ර 10ක්, මුද්‍රණ යන්ත්‍ර 3ක්, මල්ටිමීඩියා ප්‍රොජෙක්ටරයක්, ඩුප්ලෝ මැෂින් එකක් සහ පරිගණක පුටු කට්ටල 10ක් මිලදී ගෙන තිබූ අතර, එම උපකරණ අදාළ කාර්යයට යෙදවීමට කටයුතු නොකර සභාවේ විවිධ අංශවල භාවිතා කරමින්ද රු.153,744 ක් වටිනා පරිගණක 2 ක් ප්‍රයෝජනයට නොගෙන ගබඩාවේ ද පැවතුණි.

3.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්
----------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව සතු වාහන 4 ක් වර්ෂ 2 සිට වර්ෂ 9 දක්වා කාලයක් නිෂ්කාර්යව පැවැතුණි.

(ආ) සුසාන භූමියේ ආරක්ෂිත වැට ඉදිකිරීමේ කර්මාන්තය සඳහා 2014 දෙසැම්බර් 12 මිලදීගෙන තිබූ රු.43,040ක ඉදිකිරීම් ද්‍රව්‍ය ඒ සඳහා යොදා නොගෙන නිෂ්කාර්යව තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට යන්ත්‍රෝපකරණ ශේෂය තුළ වූ අක්‍රීය තත්වයේ පැවති රු.145,000 ක් වටිනා ක්ලෝරිනේටරයක්, රු.149,000 ක් හා රු.106,030 ක් වටිනා ඡායා පිටපත් යන්ත්‍ර 2 ක් හා රු.878,200 වටිනා ජල මෝටර් 4 ක් ගබඩාවේ පැවති අතර, 2016 වර්ෂයේදී ලද රු.143,000ක් වටිනා කොන්ක්‍රීට් මිශ්‍රණය මේ දක්වා භාවිතාකර නොතිබුණි.

3.4 හඳුනාගත් අලාභ
--------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ 2014 සහ 2015 වර්ෂයන්හීදී ක්‍රියාත්මක කර තිබූ යෝධ නිදිකුම්බා ව්‍යාපෘතිය සඳහා සභා අරමුදලින් රු.1,119,479ක් දරා තිබූ නමුත්, ව්‍යාපෘතිය අසාර්ථක වීම හේතුවෙන් ප්‍රාදේශීය ලේකම් විසින් රු.891,000 ක මුදලක් පමණක් ප්‍රතිපූර්ණය කර තිබූ අතර, 2015 සැප්තැම්බර් 9 වන විට ඉතිරි ප්‍රතිපාදිත මුදල් අමාත්‍යාංශය වෙත යවා තිබූ බැවින් ප්‍රතිපූර්ණය නොවූ රු.228,479 ක මුදල සභා අරමුදලට පාඩුවක් වී තිබුණි.

(ආ) තනතුරු 6 ක් සඳහා ස්ථිර පත්වීම් 8 ක් ප්‍රදානය කර 2015 දෙසැම්බර් 11 දිනැතිව එකී ස්ථිර පත්වීම අවලංගු කිරීම හේතුවෙන් එම නිලධාරීන් 8 දෙනා විසින් 2016 මාර්තු 01 දිනැතිව සභාවට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් ගොනුකර තිබුණු අතර, නිසි උපදෙස් ලබා

ගැනීමකින් තොරව හා චක්‍රලේඛවලට පටහැනිව කටයුතු කිරීම හේතුවෙන් රු.500,000 ක් නිතීඥ ගාස්තු ලෙස ගෙවීමට සිදුවී තිබුණි.

(ඇ) ටී.බී. තෙන්නකෝන් අනුස්මරණ ළමා උද්‍යානයේ භූමිය හා වැට සකස් කිරීමේ කර්මාන්තය වෙනුවෙන් ගෙවීම් කිරීමේදී අත්තිකාරම් මුදල අඩු නොකර අත රැඳවුම් මුදල් ඇතුළුව මුළු මුදලම ගෙවා තිබූ බැවින් ගෙවූ අත්තිකාරමින් හිලව්කර ගැනීමට නොහැකිව තිබූ රු.60,000 ක් සභාවට පාඩුවක් වී තිබුණි.

3.5 කොන්ත්‍රාත් පරිපාලනය

----------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මානිංගමුව ගැඹුරු නල ළිඳක් ඉදිකර ජල පොම්පය හා උපාංග සවිකිරීමේ ව්‍යාපෘතිය

--------------------------------------------------------------------------------------------

ප්‍රතිපාදන මුදල රු.1,200,000 ක් වූ උක්ත ජල ව්‍යාපෘතියක් ඉටුකිරීමට ප්‍රජාමූල සමිතියක් සමඟ ගිවිසුම්ගතවී තිබූ අතර, රු.512,500 ක් වටිනා නල ළිං උපකරණ මිලදීගෙන ගිවිසුම්ගතවූ ස්ථානයෙන් බැහැර ස්ථානයක ළිඳ ඉදිකර තිබුණි.
සභාවෙන් නිසි අධීක්ෂණයක් සිදු නොවීම හේතුවෙන් ප්‍රතිපාදන මුදල් ඵලදායී ලෙස උපයෝජනය කිරීමට නොහැකි වී තිබුණි.

(ආ) තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන ගොඩනැගිල්ල නවීකරණය

------------------------------------------------------------------

යථෝක්ත කර්මාන්තය රු.1,246,622ක මුදලකට ඉටුකිරීම සඳහා පුද්ගලික සමාගමක් සමඟ ගිවිසුම්ගතව අත්තිකාරම් ලෙස රු.249,324ක් ගෙවා තිබුණු අතර, රු.169,128ක වැඩ කොටසක් පමණක් නිමකර කර්මාන්තය නවතා තිබීමෙන් සභාවට රු.80,196ක පාඩුවක් සිදුව තිබුණි. ගිවිසුම් ප්‍රකාරව රු.119,987ක ප්‍රමාද ගාස්තුවක් ද අයකර ගත යුතුව තිබුණි.

3.6 ව්‍යාපෘති ප්‍රමාද කිරීම

-------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ 2015 වර්ෂය තුළ ඉටු කිරීමට යෝජිතව තිබූ කර්මාන්ත 3 ක් සඳහා රු.900,000 ක ප්‍රතිපාදන වෙන්වී තිබුණද, 2016 දෙසැම්බර් 31 දින වන විට වටිනාකම රු.303,056 ක වැඩ ප්‍රමාණයක් පමණක් ඉටුකර තිබුණි.

(ආ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ 2016 වර්ෂය තුළ ඉටු කිරීමට අනුමත ප්‍රතිපාදිත මුදල රු.800,000 ක් වූ ව්‍යාපෘති 2 ක් ඉටුකර නොතිබුණි.

3.7 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

----------------------------------

කසල කළමනාකරණ ක්‍රියාවලිය සඳහා 2015 හා 2016 වර්ෂවල පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ රු.1,329,560 ක් වැයකර කොම්පෝස්ට් අංගනයක් හා එයට ගබඩා කාමරයක් ඉදිකර තිබූ නමුත්, එය ක්‍රියාකාරිව නොතිබුණු අතර, ප්‍රදේශයේ දෛනිකව එකතුවන කසල ටොන් එකක ප්‍රමාණය කසල බැහැර කරන භූමියේ රඳවා ගනිමින් පැවතිණි.

04. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

------------------------------------------

4.1 විගණන හා කළමනාකරණ කමිටු

--------------------------------------

සමාලෝචිත වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු එකක් පමණක් පවත්වා තිබුණි.

4.2 අයවැය පාලනය

-------------------

(අ) ආදායම් විෂයයන් 11 ක සියයට 29 සිට සියයට 91 අතර පරාසයකින් ඉලක්කගත ආදායම් උපයා ගැනීමට සමත් වී නොතිබුණු අතර, වැය විෂයයන් 15 ක ශුද්ධ ප්‍රතිපාදනය සහ තථ්‍ය වියදම් අතර සියයට 34 සිට සියයට 98 දක්වා පරාසයක විචලනයන් පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුලදී ආදායම් හා වියදම් විෂයයන් අතර, ප්‍රතිපාදන මාරු කිරීමෙන් අනතුරුවද, අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර, සැලකියයුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

5. පද්ධති හා පාලනය

----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) ණයගැති හා ණයහිමි පාලනය.

(ආ) වත්කම් කළමනාකරණය.

(ඇ) අයවැය පාලනය

(ඈ) වාහන පාලනය